**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය.**

---

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 23 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 265.80 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 259.40 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.40 ක් හෙවත් සියයට 2.41 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 252.75 | 249.65 | 3.10 | 1.22 |
| මූලධන | 13.05 | 9.75 | 3.30 | 25.28 |
| එකතුව | 265.80 | 259.40 | 6.40 | 2.41 |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 32601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාවෙ | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.00 | 8.88 | 4.00 | 7.13 | 40.00 | 23.90 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/412/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂය රු.19,116 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ පොදු තැන්පත් ගිණුම් තුනක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.131,150 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000/0000/00/0013/0145/000 | 250 |
| 6000/0000/00/0018/0126/000 | 38,000 |
| 6000/0000/00/0019/0029/000 | 92,900 |
| | 131,150 |

## 2.5 විගණන නිරීක්ෂණය

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 05 කට 2017 ජූලි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.13,616,260 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන 03 ක් ඉදිකිරීමේ මූලධන වැය විෂයය සඳහා රු.3,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී නිසි සැලසුමක් නොතිබූ බැවින් එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 52 කදී ලබාදී තිබුණු එකතුව රු.502,686 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 1 ත් මාස 6 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. තවද එක් අත්තිකාරමක් පියවීමට පෙර අවස්ථා 14 කදී එකතුව රු.180,873 ක් වූ තවත් අත්තිකාරම් ලබාදී තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 32601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.342,364 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) එක් වාර්ෂික උත්සවයක් සඳහා රු.10,000 ක උත්සව අත්තිකාරමක් මාස 08 කින් අයකර ගැනීමේ පදනමින් ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ලබාදුන් උත්සව අත්තිකාරම සම්පූර්ණයෙන් ආපසු අයකර ගැනීමට ප්‍රථම නිලධාරීන් 23 දෙනෙකු වෙත එකතුව රු.230,000 ක උත්සව අත්තිකාරම් නැවතත් ලබාදී තිබුණි.

**3.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු ප්‍රති වෛරස් මෘදුකාංග 105 ක් හා යූපීඑස් 54 ක් රු.452,928 කට මිලදී ගෙන තිබුණි.

**3.6.2 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.6.3 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 අගෝස්තු 20 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 94 | ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳිය නොහැකි වුවද, සේවාවන් හෝ සැපයුම් නොවන පුනරාවර්ථන වැය විෂයයන් 03 ක |

| | |
|---|---|
| | ඉතිරිවීම් ඉක්මවා රු.518,752 ක බැරකම් සඳහා බැඳීම් ඇති කර ගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 138 | එකතු වටිනාකම රු.114,060 ක වවුචර් 02 ක් සඳහා වියදම සහතික කර නොතිබියදී ගෙවීම් කර තිබුණි. |
| (ආ) 1997 ඔක්තෝබර් 14 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | තනතුරක වැඩබැලීමේ උපරිම කාල පරිච්ඡේදය මාස 03 කට සීමා කර තිබුණු නමුත්, මාස 14 කට වඩා වැඩි කාලයක සිට ප්‍රජා විශෝධන කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු අවස්ථා 02 කදී පත්කර තිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහිත උපචිත පදනමට පිළියෙල කළ ගිණුම් කට්ටලය 2017 ජුනි 30 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3.9 අවිධිමත් ගනුදෙනු**

----------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම**

-----------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු මුළු එකතු වටිනාකම රු.13,746,763 ක් වූ ප්‍රසම්පාදන 08 සිදුකර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 හි සඳහන් මිල සැඳහුම් ක්‍රමයට අනුව මිල ගණන් 03 ක් ලබාගෙන අවම මිලට මිලදී ගත් බව ඇඟවීමට උත්සාහ කර තිබුණි. මිල ගණන් කැඳවීමේ ලිපි යැවූ බව, මිල ගණන් සහිත ලිපි ලැබුණු ආකාරය හා මිල ගණන් විවෘත කිරීමේ කමිටුවක් ඉදිරියේ විවෘත කළ බව හා තාක්ෂණික ඇගයීම් සිදුකර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගත් බව තහවුරු කර ගැනීමට කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එසේම අදාළ භාණ්ඩ හෝ සේවා සපයා ගැනීම සඳහා තෝරා ගත් සැපයුම්කරු හැරුණු කොට මිල ගණන් එවා තිබුණේ යැයි සඳහන් ඉතිරි ලංසුකරුවන්ගේ ලිපිනයන් හා දුරකථන අංක ව්‍යාජ ඒවා වන බවත්, සමහර මිල ගණන් එකම ලංසුකරුවෙකු ඉදිරිපත් කර තිබුණු බවත් පරීක්ෂණවලදී තහවුරු විය.

(ආ) රජයේ ප්‍රම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ඉක්මවා නැවත ඇණවුම් නොකළ යුතු වුවද, රු.600,932 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණු සැපයුම්කරුවෙකු

වෙතින් නැවත ඇණවුම්කර රු.512,038 ක් පිරිවැය වූ කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

## 3.10 කාර්යසාධනය

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ පද්ධතිය තුළ සිටින මහේස්ත්‍රාත්වරුන්, නීතිඥවරුන්, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය. එහෙත් ඒ සඳහා සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ප්‍රජා විශෝධන කාර්යාල සහිත මහේස්ත්‍රාත් අධිකරණ 100 කින් 10 ක සිටින ඉහත සඳහන් නිලධාරීන්ට පමණක් සමාලෝචිත වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා තිබුණි. තවද ප්‍රජා විශෝධන කාර්යාල 100 කින් 39 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අධීක්ෂණය කර තිබුණු අතර එම කාර්යයද සැලැස්මකින් තොරව සිදුකර තිබුණි.

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වාදුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
| --- | --- | --- |
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.5 (ආ) | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම |

## 3.12 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ පරීක්ෂක නිලධාරීන් පුහුණු කිරීමට ක්‍රියාත්මක කරන ලද ප්‍රජා විශෝධන ඩිප්ලෝමාව සඳහා ප්‍රධාන කාර්යාල ලිපිකරුවන් 04 දෙනෙකු වෙනුවෙන් රු.91,000 ක් වැය කර තිබුණි.

(ආ) හිටපු කොමසාරිස්වරයා විසින් භාවිතා කරනු ලැබූ ඩයලොග් ටී.වී සම්බන්ධතාවය එම තනතුර පුරප්පාඩු වීමෙන් අනතුරුව විසන්ධි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.10,858 ක් වැය කිරීමට සිදුවී තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 124 | 109 | 15 |
| (iii) | ද්විතියික මට්ටම | 468 | 387 | 81 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 08 | 03 |
| | එකතුව | 607 | 507 | 100 |